# කුජ - ශනි - රාහු විවාහයට අසුබද?

**ජ්‍යොතිෂය යනු භූගෝලය, ගණිතය සහ තාරකා විද්‍යාව යන විෂයන් තුනම එකතු වූ විෂයකි. මෙම විෂය ඉතා ගැඹුරු විෂයක් වන අතර, මද දැනුම ඇති අය ජ්‍යොතිෂය කිරීමට යාමෙන් අද ජ්‍යොතිෂය විහිළු විෂයක් බවට පත්ව ඇත. ජනතාව ක්‍රම ක්‍රමයෙන් ජ්‍යොතිෂයෙන් බැහැර වේ. තවත් සමහර දෙමාපියන් කුජ 02 කුජ 8 කුජ 12 / ශනි 02 ශනි 07 ශනි 8 ශනි 12 / රාහු 02 රාහු 07 රාහු 08 රාහු 12 යන ග්‍රහයන් තිදෙනා සහ රාශි ජ්‍යොතිෂයට අනුව විවාහයට අසුභ රාශි ලෙස හංවඩු ගසා ඇත.**

යමකුට අපලයක් එලදීමට කරුණු කිහිපයක් ඇත.

අපල ග්‍රහයාගේ මහ දශාවේ අපල ග්‍රහයාට අයත් අතුරු දශාව එක අවස්ථාවකි.

අපල ග්‍රහයාගේ මහ දශාවේ 22 දෙර්කාණාධිපති, විපත් නැකත්වල ගමන් කරන සහ වද නැකතේ ගමන් කර ග්‍රහයන්ගේ අතුරු දශා වලදී ද අපල එල දේ.

සමහර වර්ෂවල එම වර්ෂයේම සමහර මාස වල මෙම කුජ, ශනි වක්‍රව සිටිනා අවස්ථා ද ඇත. නමුත් 90%ක්ම ජන්ම පත්‍ර වල එය සඳහන් කර නැත. මෙම කරුණු විවාහයට අතිශයෙන්ම බලපෑම් කරනු ඇත.

කුජ මහ දශාවෙන් උපන් අයට කුජගෙන් විවාහ දෝෂයක් නැත. ශනි මහ දශාවෙන් උපන් අයට ශනිගෙන් විවාහ දෝෂයක් නැත. රාහු මහ දශාවෙන් උපන් අයට රාහුගෙන් විවාහයට දෝෂයක් නැත. දරුවා කුඩා කලම එය ගෙවා ඉවර කර ඇත. නමුත් දෙමාපියන් ගෙවා ඉවර කරපු දෝෂයට අපලය ඇති කෙනකු සොයා විවාහ කර දෙති. එනිසා විවාහ ජීවිතය අවුල් වේ. වක්‍ර ග්‍රහයන් සිටිනා විට විවාහ දෝෂයක් නැත. එය බලපාන්නේ වෙනත් කරුණු සඳහාය.

එනිසා තම දරුවා සැබවින්ම විවාහයට කුජ, ශනි, රාහු තිබේ දැයි සොයා බලා ගැළපිය යුතුය. දෙනට නැකත, සිත නැකත, මුවසිරස නැකත යන නැකත් 03න් උපන් දරුවන්ට කුජ දෝෂය ගැළපීමෙන් විවාහය අවුල් වේ. එම දරුවන්ට කුජ දෝෂයක් නොමැත. අනුර නැකත, පුෂ නැකත, උත්‍රපුටුප නැකත යන නැකත්වලින් උපන් දරුවන්ට විවාහ දෝෂයක් නැත. සියාවස නැකත, සා නැකත, අද නැකත උපන් දරුවන්ට විවාහ දෝෂයක් නැත. එම දරුවන් රාහු මහ දශාවෙන් උපත ලබා ඇති නිසා රාහුගෙන් ඇති වෙන විවාහ දෝෂයක් නැත.

වැදගත් :- සමහර අය හත 07 පෙනෙන ලෙස ඉල්ලා සිටින බව දක්නට ලැබේ. සමහර ලග්න වලට 07 වැන්න බාධක ස්ථාන ලෙස ජ්‍යොතිෂය පෙන්වා ඇත. 07 පෙනෙන ලෙස ඉල්ලීම් කිරීම තුළ ඔබ ඔබේ දරුවාට තමා විසින් ම අපලයක් ළඟා කර දේ.

වැදගත් :- මංගල යෝග.

ශනි මංගල යෝගය, කුජ මංගල යෝග වැනි යෝග ජ්‍යොතිෂයේ විවාහයට බලපෑම් කරන දෝෂ ලෙස පෙන්වා දිය හැක. යෝගයක් ඇති වීමට නම් එම ග්‍රහයන් අංශක 13 ඇතුළත සිටිය යුතුය. නැතහොත් එය යෝගයක් නොවේ. තවත් කරුණක් පෙන්වා දෙමි. යෝගයට අයත් ග්‍රහයන් දෙදෙනාගෙන් (උදා:- ශනි කුජ යෝගය) සෙනසුරු මහ දශාවෙන් උපන් දරුවාට අපලයක් නැත. එම දරුවාට කුජ මහ දශාව ලබන්නේ ජීවිතයේ අවසාන භාගයේදීය. එසේ නම් මංගල යෝගය දරුවාට තිබේද? මෙය පිළිබඳව ද සොයා බලා කටයුතු කිරීම තුළ දරුවන්ගේ ජීවිත සාර්ථක වනු ඇත.

**සුරගුරු ප්‍රකාශන ආයතනය විධායක අධ්‍යක්ෂිකා, ශ්‍රී ලංකාභිමානි ජනරංජන කීර්ති ශ්‍රී දේශමාන්‍ය**

**ශෝභනී ද සොයිසා**
**0112773788,**
**0779290240.**

# ආදි රාජකීය ක්‍රිකට් තරගාවලිය 24 වැනිදා

ආදි රාජකීය අන්තර් වයස් කාණ්ඩ සැහැල්ලු පන්දු දිවා රාත්‍රී ක්‍රිකට් තරගාවලිය දෙසැම්බර් 24 වැනිදා පෙරවරු 10 සිට කොළඹ රාජකීය විද්‍යාලයීය ක්‍රීඩා පිටියේදී පැවැත්වේ.

මල්වෙඩි සංදර්ශන, මැජික් සංදර්ශන, සතුටු උයන ඇතුළු පවුලේ සැමට විනෝදවීමට අවස්ථා රැසක්ද එදින පැවැත්වේ. මේ පිළිබඳ සියලු විස්තර 0770217720 හා 0706435918 යන අංක වෙතින් ලබාගත හැකිය.

විදේශ අධ්‍යාපනය
U.K/U.S.A/CANADA
AUS/NZ/JAPAN
සිසුනට බැංකුවේ මුදල් තැන්පත් කිරීම විශ්වාසනීයව
(මහනුවර අවට සිසුන් විශේෂයි) 070-3390170




BANK BALANCE
බැංකුවේ මුදල් තැන්පත් කිරීම
3.5% STUDENT FINANCE SERVICES
Registered Company
Next To HNB BANK
Hot line 0777 409 106 Tell : 0114 282 747
226, Baseline Road - COLOMBO-09
E-mail: studentfinanceserviceslanka@gmail.com
STUDENT TOURIST
UK - CANADA
USA - AUSTRALIA
NEW ZEALAND
EUROPE

## ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය සඳහා ලියාපදිංචි කිරීම - 2023

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා 2023 අධ්‍යයන වර්ෂයට ලියාපදිංචිවීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් 2023 ජනවාරි මස 31 දින දක්වා අයදුම්පත් බාරගනු ලැබේ.

#### අධ්‍යාපන සුදුසුකම්

(අ) දේශීය අයදුම්කරුවන් සඳහා

01) ප්‍රාචීන ප්‍රාරම්භ හෝ ප්‍රාචීන මධ්‍යම විභාගයෙන් භාෂාත්‍රයෙන් සමත්වීම

හෝ

02) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී බෞද්ධ විෂයයක් සහිත ව යටත් පිරිසෙයින් විෂයයන් තුනකින් එකවර සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණයට අවම වශයෙන් ලකුණු 30 ක් ලබා තිබිය යුතුය.)

හෝ

03) පාලි, සංස්කෘත, සිංහල, ඉංග්‍රීසි භාෂා යන විෂයයන්ගෙන් එකක් සහිත ව අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් එකවර සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණයට අවම වශයෙන් ලකුණු 30 ක් ලබා තිබිය යුතුය.)

හෝ

04) බෞද්ධ ධර්මාචාර්ය හෝ දහම් සරසවිය බුද්ධධර්ම ඩිප්ලෝමා විභාගය සමත්වීම සමග අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂය ධාරාවකින් යටත් පිරිසෙයින් විෂයයන් තුනකින් එකවර සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණයට අවම වශයෙන් ලකුණු 30 ක් ලබා තිබිය යුතුය.)

හෝ

05) පිළිගත් විශ්වවිද්‍යාලයක (දේශය හෝ විදේශීය) උපාධියක් හෝ ඊට සමාන යැයි මෙම විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් සමාන සුදුසුකම් ලබා තිබීම.

හෝ

06) ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ බුද්ධධර්ම, පාලි, සංස්කෘත හෝ ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමා පාඨමාලාවලින් එකක් සමත්වීම

හෝ

07) ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ හෝ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දහම් සරසවි බුද්ධධර්ම උසස් ඩිප්ලෝමා පරීක්ෂණයෙන් සමත්වීම හා දහම්පාසල් ගුරු සේවයේ යෙදීම.

හෝ

08) අ.පො.ස. (උසස් පෙළ) විභාගයට සමාන යැයි ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ සනාතන සභාවට පිළිගත හැකි බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළ විෂයයක් සමග වෙනත් කවර හෝ පරීක්ෂණයක් සමත්ව තිබීම.

**(ආ) විදේශ අයදුම්කරුවන් සදහා**

01) දේශීය අයදුම්කරුවන් සඳහා නියමිත ඉහත 01-08 දක්වා සඳහන් සුදුසුකම්වලින් එකක්

හෝ

02) ලන්ඩන් (උසස් පෙළ) විභාගය හෝ අ.පො.ස. (උසස් පෙළ) විභාගයට සමාන යැයි විශ්වවිද්‍යාලීය සනාතන සභාවට පිළිගත හැකි වෙනත් කිසියම් සුදුසුකමක් ලබා තිබීම.

- සියලු අයදුම්කරුවන් දෙවතාවකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය, පිරිවෙන් අවසාන විභාගය, ගණිතය හා සිංහල ඇතුළු විෂයයන් හයකින් සම්මාන තුනක් වත් සහිතව සමත් ව තිබිය යුතුය.

#### අධ්‍යයන විෂයයන්

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා මෙම විශ්වවිද්‍යාලයේ අනුමත විෂයයන් පහත සඳහන් වේ.

පාලි, බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, සංස්කෘත, සිංහල, ඉංග්‍රීසි, පුරාවිද්‍යාව, සමය අධ්‍යයනය හා තුලනාත්මක දර්ශනය.

#### අයදුම්පත් ලබාගන්නා ආකාරය

විස්තර හා අයදුම්පත් තැපැල් මගින් ලබාගන්නේ නම්, දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක 711202 දරණ ගිණුමට බැරවන පරිදි රු.750/- ක් ගෙවා ලබාගන්නා ලද ලදුපත සමග 10×8 ප්‍රමාණයේ රු. 150.00 ක මුද්දර ඇලවූ ලිපිනය ලියන ලද ලියුම් කවරයක් අයදුම්පත් ඉල්ලීම් ලිපියක් සමග **සහකාර ලේඛකාධිකාරී, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, නො. 214, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.** යන ලිපිනයට 2023.01.23 දිනට පෙර එවිය යුතුය.

නැතහොත් අයදුම්පත පැමිණ ලබා ගන්නේ නම් සති අන්තයේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා උක්ත ලිපිනයේ පිහිටි පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානයේ සරප් වෙත ගාස්තු ගෙවා විස්තර හා අයදුම්පත් ලබාගත හැකිය.

එසේත් නැතහොත් විස්තර හා අයදුම්පත www.bpu.ac.lk වෙබ් පිටුවට පිවිස ලබාගත හැකි ය.

සැ.යු.

* අයදුම්පත් හා විස්තර වෙබ් අඩවිය ඔස්සේ හා තැපැල් මගින් ලබාගන්නේ නම් දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක 711202 දරන ගිණුමට බැර වන පරිදි රු. 750/- ක් ගෙවා ලබාගන්නා ලද ලදුපත සමග එම අයදුම්පත ඉදිරිපත් කළ යුතුවේ. බැංකුවට ගෙවීම් සිදුකරන ගෙවීම් පතෙහි ඔබගේ නම ඉදිරියෙන් B.A ලෙස සංකේත අංකය යෙදීම අනිවාර්ය වේ.

* ප්‍රමාණය ඉක්මවා ශිෂ්‍යයන් අයදුම් කර ඇති අවස්ථාවක, විශ්වවිද්‍යාලය විසින් සකස් කරනු ලබන නිර්ණායකවලට අනුව තොරා ගැනීම් සිදුකරන අතර ඉහත (1), (2),(3), සහ (4) යන සුදුසුකම් සඳහා මූලිකත්වය ලබාදී අනුපිළිවෙළින් ශිෂ්‍ය බඳවා ගැනීම සිදුකරනු ලැබේ. තෝරාගනු ලබන ශිෂ්‍ය ප්‍රමාණය විශ්වවිද්‍යාලයේ සම්පත් මත තීරණය වන බැවින් විශ්වවිද්‍යාලය විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

අයදුම්පත් නිකුත් කිරීමේ අවසාන දිනය 2023.01.26 වේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2023.01.31 වේ. එදිනට පෙර නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **'සහකාර ලේඛකාධිකාරී, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, නො. 214 බෞද්ධාලෝක මාවත, කොළඹ 07'** යන ලිපිනයට යොමු කළ යුතුය. අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

විමසීම්:- දුරකථන අංක : 0112 580 609 /0112 502 944

**ලේඛකාධිකාරී**
**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,**
**214 බෞද්ධාලෝක මාවත,**
**කොළඹ 07.**
**2022 ඔක්තෝබර් 21**

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

### මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
### ඩිජිටල් අධ්‍යාපන හා වෘත්තිය සංවර්ධන මධ්‍යස්ථානය

### ව්‍යවහාරික දෙමළ භාෂා ඩිප්ලෝමා පාඨමාලාව - 2023
### பயன்பாட்டுத் தமிழ் மொழி டிப்லோமா பாடநெறி - 2023
### Diploma in Applied Tamil Language - 2023

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයෙහි ඩිජිටල් අධ්‍යාපන හා වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය මඟින් පවත්වනු ලබන ව්‍යවහාරික දෙමළ භාෂා ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

පාඨමාලාව මඟින් ආවරණය කෙරෙන විෂය ක්ෂේත්‍ර

- අක්ෂර භාවිතය හා ව්‍යාකරණ අවබෝධය
- සාහිත්‍යාවබෝධය
- දෙමළ සංස්කෘතිය
- කෘති පරිශීලන හැකියාව
- පරිවර්තනය හා පරිවර්තන ක්‍රම
- ප්‍රායෝගික ලේඛනය
- කථනය.

SLQF Level 03 NVQ 05

**සුදුසුකම්:**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය ඕනෑම විෂයයන් තුනක් සඳහා අවම වශයෙන් එක් වරකදීසාමාන්‍ය සාමර්ථ්‍යය තුනක් සහිතව හෝ ඊට සමාන යෝග්‍යතාවකින් යුතුව සමත්වීම

**හෝ**

ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සිවුවැනි ස්තරය සහිත පදනම් පාඨමාලාවක් සම්පූර්ණ කර සිටීම. (විශ්වවිද්‍යාලයීය සනාතන සභාවේ අනුමැතියට යටත් වූ පදනම් පාඨමාලා පමණක් මෙහිදී සලකාබැලේ.)

**හෝ**

අවම වශයෙන් වසර 12ක පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කර යෝග්‍යතා පරීක්ෂණයක් සමත් වී තිබීම හා ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ (SLQF) දෙවැනි ස්තරය සහිත පදනම් පාඨමාලාවක් සම්පූර්ණ කර සිටීම.

**කාලය:** එක් අවුරුදු පාඨමාලාවකි.

**දේශන:** ඉරිදා දිනවල පෙරවරු 8.00 සිට පස්වරු 4.30 තෙක්
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දී පැවැත් වේ.

(අවස්ථානුකූලව දේශන මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) සහ ZOOM ඔස්සේ මාර්ගගත ක්‍රමවේදයෙන් ද පවත්වනු ලැබේ.)

**අයදුම්පත් :** ගංගොඩවිල මහජන බැංකුවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල ගිණුම් අංක 013010001678 ට බැර වන පරිදි රු. 1000/- ක මුදලක් ගෙවා ලබාගත් රිසිට්පත හා අදාළ ලේඛන සමග අයදුම්පත නියමිත පරිදි සම්පූර්ණ කර 2022.12.31 දිනට පෙර අප වෙත එවන්න.

(අයදුම්පත ලබා ගැනීම සදහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨ වෙබ් අඩවියට පිවිසෙන්න)

අයදුම්පත් එවිය යුතු ලිපිනය - පාඨමාලා සමායෝජක,
ව්‍යවහාරික දෙමළ භාෂා ඩිප්ලෝමා පාඨමාලාව,
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය.
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාගය,
ගංගොඩවිල, නුගේගොඩ..

**පාඨමාලා ගාස්තුව රු. 50,000/- (වාරික දෙකකින් ගෙවිය හැකිය)**

ලේඛකාධිකාරී,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල, නුගේගොඩ.




# තාමරසි මහවත්තගේ ගෙන් අපූරු වූ අබලන්

තාමරසි මහවත්ත ලියූ අපූරු වූ අබලන් ළමා සාහිත්‍ය කෘතිය "ජැම් පෑට් ට්‍රී" ප්‍රකාශනයක් ලෙස නිකුත් විය.

අබලන්ට නම වැටුණු හැටි, කොරේ පිටට මරේ, තට්ට තනියම අලුත් සෙල්ලමක්, කබලෙන් ළිපට කාටත් වැරදිලා ඇතුළු රසබර පරිච්ඡේද රැසකින් යුතු මෙම කෘතියට ළමා මනස ඇදගන්නා ආකාරයේ අලංකාර චිත්‍ර රැසක්ද ඇතුළත්ය.

# දැන් ඉතින් අම්මා නැතුව ජීවත් වෙන්න අපි හුරු වෙන්න ඕනෑ තාත්තෙ

"තාත්තෙ.. අදවත් බොන්නෙ නැතුව ගෙදර එන්න.. රෑට පන්සල් යන්නත් තියෙනවනෙ.."
තාත්තා නිවසින් පිට වෙන්නට සූදානම් වෙද්දී ඔහු වෙත ගිය දිනේෂි බැගෑපත් ස්වරයෙන් පැවසුවාය. වෙනදාට නම් ඇය එවන් ඉල්ලීමක් කරන්නේ තාත්තාගේ ගෙල බදාගෙන, මුහුණට මුහුණ තබාගෙන හෝ උකුළේ වාඩිවීගෙනය.

එහෙත් දැන් ඇයට ඔහු දැනෙන්නේ අමුත්තෙකු ලෙසය. එම නිසාම ඇය තේ කෝප්පයක් කනප්පුව මත වසා තබනවා මිස ඔහුගේ අත මානයටවත් යන්නේ නැත. යෙදෙමින් තිබුණේ ඔවුනතර ඇති දුරස්තර බව දිනෙන් දිනම වර්ධනය වෙන්නට කරුණුකාරණාය. ඒවා තමා තුළ මොන තරම් වේදනාවක් ජනිත කළේදැයි දැන සිටියේ දිනේෂි පමණකි. ඇය ඒවා ගැන සකුණ හෝ සේනානි සමඟවත් කතා කළේ නැත. ඇය බලා සිටියේ නිදහසේ අම්මා සමඟ කතා කරන්නට දිනක් එළඹෙන තුරුය. සවසට පවතින අධික වැස්ස නිසාත්, ලොකු මල්ලී ගේ උදහසට ලක්වීමට ඇති බිය නිසාත් දිනේෂි වැඩි වේලාවක් පහන් පැල ළඟ රැඳුණේ නැත. අම්මා සිහිනයක් දිගේ හෝ ළඟට එනු ඇතැයි ඇය බලාපොරොත්තු වූ දවස් බොහොමයක් තිබුණත් ඒවා ගෙවී ගියේ ඇය තුළ දෙම්නස පමණක් ඉතිරි කරමිනි.

**දෙසැම්බර් තිස් එක් වෙනිදා රෑට ගමේ සියල්ලෝම පන්සලට එක්රැස් වෙති. රාත්‍රී දොළහට පිරිත් ශ්‍රවණය කර, හාමුදුරුවන් ලවා පිරිත් නූල් බඳවාගෙන, එකිනෙකාට සුබ පතාගෙන එළඹෙන අලුත් අවුරුද්ද වෙනුවෙන් පේවෙති. ගමේ ගෙවල්වලින් රැගෙන එන කිරිබත්, කැවුම්, කෙසෙල් ගෙඩි කා තේ පානය කර විසිර යන්නේ සැහැල්ලු, සතුටු සිත් ඇතිවය. පෝයට වඩා වෙනසක් ඇති හෙයින් තිස් එක් වෙනිදා රෑ පන්සල් යන්නට දිනේෂි ප්‍රිය කළාය. එහෙත් මෙවර නම් ඇයට යන්නට වුවමනා වූයේ ඒ වෙනස අත්දකින්නට නොව තාත්තා වෙනස් කර ගන්නටය.**

"තාත්තා එනවා නේද..?" ඇය නැවතත් විමසුවේ එහෙයිනි.

යන්නට ගිය ගමන නවතා ඇඳේ වාඩි වූ කිත්සිරි බිම බලාගෙන දෑතින් හිස පිරිමැද ගත්තේය. මඳ වේලාවකට පසුව ඔහු නැවත හිස ඔසවා ලොකු දියණිය දෙස බැලුවේ බැගෑපත් ලෙසය. සෑහෙන කලකට පසු තාත්තාත් දුවත් සෘජුව මොහොතක් එකිනෙකා දෙස බලා සිටියහ. ඔහුගේ මුහුණේ වැහැරුණ ස්වභාවය ඇයට දරා ගන්නට නොහැකි වූයේය. පරණ පුරුදු තාත්තා අම්මාත් සමඟම මිය ගොස් ඇත්තේ නොවේදැයි ඇය කල්පනා කළාය.

"ජිනා නැති වුණායින් පස්සෙ එන පළවෙනි ජනේරුව.."

කිත්සිරි තොල මතුරා ගත්තේය. දිනේෂිට නොරිස්සුමක් දැනුණේ තාත්තා අතීතයේ පමණක්ම ජීවත් වෙන බැවිනි.

ජනප්‍රිය ලේඛිකා චන්දි කොඩිකාර ලියන නවකතාව

42 කොටස



"දැන් ඉතින් අම්මා නැතුව ජීවත් වෙන්න අපි හුරු වෙන්න ඕනැ තාත්තෙ.. ඔයා ඔහොම බීලා එනකොට අපිට අම්මා විතරක් නෙමෙයි තාත්තත් නැති වෙනවා කියලා දන්නෙ නැද්ද..?"


**බොහෝ දිනකට උඩදී කියන්නට වුවමනා වුවත් තාත්තා පියවි සිහියෙන් නොසිටි නිසා නොකියූ දෙය නිරායාසයෙන්ම ඇගේ මුවින් පිට වූයේය. සුසුමක් හෙළූ කිත්සිරි නැවතත් බිම බලා ගත්තේය.**

"මම ඒක නොදන්නවා නෙමෙයි ලොකු දුව.. මම හැමදම උදේට ගෙදරින් යන්නෙ ආයෙනම් බීලා එන්නෙ නෑ කියලා හිතාගෙන.. ඒත් ජිනා නැති මේ ගෙදෙට්ට සිහියෙන් එන්න හිත හද ගන්න මට බෑ.. මට සමා වෙන්න පුතේ.."

"හිතුවොත් කරන්න බැරි දෙයක් නෑ කියලා අපිට කියලා දුන්නෙ තාත්තමනෙ.. අද රෑ පන්සල් ගියාට පස්සෙ ඔය ජරා පුරුද්දෙන් මිදෙනවා කියලා බුදු හාමුදුරුවන්ට පොරොන්දු වෙලා එමු තාත්තෙ.."

ඇය ඕනෑකමින් කීවාය.

**දෑතේ ඇඟිලි එකිනෙක පටලා ගනිමින් සෑහෙන වේලාවක් කල්පනා කරමින් සිටි කිත්සිරි අලුත් අදිටනකින් මෙන් හිස ඔසවා බැලුවේය. ඔහුගේ දෙතොලේ සිනාවක් ද, දෑසේ අලුත් එළියක් ද තිබිණි. දිනේෂිගේ මුහුණට ද ඒ ආලෝකය වැටිණි.**



"ඔව් පුතේ.. එහෙම කරමු.. මම අද ඉක්මනට එන්නම්.. අම්මා හිටිය කාලෙ වාගෙම අපි පන්සල් යමු.."

කියමින් කිත්සිරි නැඟී සිටියේ දිනේෂිගේ සිත සතුටින් පුරවාලමිනි. ජීවිතය අලුතින්ම අරඹන්නට හැකි වෙනවා ඇතැයි ඇය උදක්ම බලාපොරොත්තු වූවාය.

ගෙදරින් පිට වී යන හැම මොහොතකම තාත්තාට වඳින්නට දරුවන් පුරුදුව සිටියත් එම පුරුද්ද ගිලිහී ගියේ ඔහු බීමතින් පැමිණෙන්නට පටන් ගත් පසුවය. නැවත වරක් එය ඇති කර ගත යුතුයයි අදිටන් කර ගනිමින් දිනේෂි දණ ගසා ඔහුට වැන්දය. කාලාන්තරයකට පසු ඔහු ලොකු දුව තුරුළු කරගෙන හිස සිප ගත්තේය. එහෙත් ඒ වැඳුම තුළවත්, සිප ගැන්ම තුළවත් අතීතයේ වූ සෙනෙහස නොතිබුණ බැව් දෙදෙනාටම දැනිණි.

**තාත්තා වංගුවෙන් හැරී නොපෙනී යන තුරුම මිදුලට වී බලා සිටි දිනේෂි සුසුමක් හෙළමින් ඉදල අතට ගත්තාය. තවමත් නිවාඩු කාලය බැවින් නංගීත් පොඩි මල්ලීත් අවදි වී සිටියේ නැත. ඇය අතු ගාන්නට වූයේ සකුණලාගේ නිවස දෙස බලාගෙනමය. නිවාඩු දිනවල පන්ති නොයන්නේ නම් වැට අද්දරට පැමිණ ඇය හා කතාබහ කිරීමට ඔහු පුරුදුව සිටියේය. සැබැවින්ම ඇයට එදිනෙදා ජීවිතයට මුහුණ දෙන්නට ශක්තිය ලැබුණේ ඒ කතාබහ තුළිනි.**

සකුණගේ කාමරයේ ජනේලය වසා තිබුණේ ඔහු පන්ති ගිය බවට සලකුණක් ලෙසිනි. ඒ දුටුවාට පසුව ඇය තුළ මිදුල අතු ගෑවේ පටන් ගත් කාර්යය අවසන් කළ යුතු නිසා මිස උනන්දුවකින් නොවේ. ඇය තුළ උද්‍යෝගය මෙන්ම ධෛර්යය ද ඇති වෙන්නේ සකුණ හරහාම පමණකි.

අලුත් අවුරුද්ද වෙනුවෙන් කොහේ හෝ ගෙදරක කැවුම් පිසෙන සුවඳ ඇගේ නාසයට ඇදී එමින් තිබිණි. ඇය ආශාවෙන් ඒ සුවඳ නාසයට උරා ගත්තාය. අම්මා සිටියේ නම් ඇයත් මොනවා හෝ කැවිල්ලක් සාද ඉන් කොටසක් පන්සලටත් රැගෙන යන්නීය. අම්මා සාදද්දී අත්උදව් දුන්නත් දිනේෂි කැවිලි සාදන්නට දැන සිටියේ නැත.

"ආච්චිලගෙ ගෙදරනම් මේ වෙනකොට කැවිලි වර්ග හුඟක් හදලා ඇති.. අපිටත් අරන් එයි ද දන්නෙ නෑ.." ඇය කල්පනා කළාය.

**ගමේ බොහෝ දෙනෙක් කැවිලි මිල දී ගන්නා බැවින් මේ දිනවල ආච්චිටත්, පොඩි නැන්දාටත් විවේකයක් තිබුණේ නැත. වෙනදානම් ඒවායින් කොටසක් මේ ගෙදරට ද ලැබෙන්නේය. එහෙත් ආච්චි තාත්තා සමඟ අමනාපයෙන් සිටින නිසා අවුරුද්දටවත් මෙහි පැමිණෙනු ඇතැයි අනාවැකි කිව නොහැකිය.**

ගෙදරට අඳින බාච්චු ගවුමකින් සැරසුණ සඳසීලි නැන්ද ඉක්මන් ගමනින් වත්ත හරහා මෙදෙසට එනු දුටු දිනේෂි ගේ සිතේ තිගැස්මක් හට ගත්තේය. උදේම කඩේට ගොස් සවස ගෙදරට එන බැවින් ඇයට සඳසීලි දකින්නට ලැබෙන්නේ බොහෝ කලාතුරකිනි. ඇය මේ එන්නේ තමා සමඟ කතාබහ කරන්නටම බව නොඅනුමානය.

**"කවුරු හරි මායි සකුණ අයියයි ගැන කේළමක්වත් කියල ද මන්දා.." මුමුණා ගනිමින් ඇය කිසිදු රටාවකින් තොරව වේගයෙන් අතු ගාගෙන ගියේ සඳසීලි නුදුටු බව අඟවමිනි.**

"දිනූ.. ටිකක් මෙහාට එනව ද..?"

වැට අද්දර නැවතුණ ඇය හඬ ගෑවාය.

**ලබන සතියට**


---

රුසියානු ළමා සාහිත්‍ය වඩාත් විකසිත වූයේ සෝවියට් යුගයේ දී. ළමා මනෝවිද්‍යාව හා සමාජ විද්‍යාව පාදක කොට ගනිමින්, සාමූහික මනෝභාවය සහිත නිර්මාණශීලී දරුවකු බිහිකර ගැනීමේ අරමුණ ඇතිව, සැලසුම් සහගතව සහ රාජ්‍ය අනුග්‍රහය ඇතිව ළමා සාහිත්‍යයක් තිබුණේ එම සෝවියට් යුගයේ රුසියාවේ පමණක් ය යන්නයි මගේ අදහස.

## රුසියානු සාහිත්‍යයේ පදනම

# යහපත් සමාජයකට මඟපෙන්වීමයි

## ප්‍රවීණ පරිවර්තක මහින්ද සෙනරත් ගමගේ



අම්මා වතුර

**මහින්ද සෙනරත් ගමගේ යනු 'රුසියානු සාහිත්‍යය මෙරට ප්‍රචලිත කිරීම සඳහා දශක දෙකකට අධික කාලයක් පුරා ඉමහත් මෙහෙයක් ඉටු කළ ප්‍රවීණ පරිවර්තකයෙකි. 'දොන් නදිය ගලා බසී', 'මගේ දගෙස්ථානය' වැනි අනගි රුසියානු පොතපත සහ ළමා කෘති විශාල සංඛ්‍යාවක් සිංහල පාඨකයා වෙත ගෙන ආ ඔහු පසුගියදා කොළඹ රුසියානු මන්දිරයේදී, ජීවිතයට වරක් පමණක් පිදෙන ලියෝ තෝල්ස්තෝයි සම්මානයෙන් පිදුම් ලැබීය. මෙම සාකච්ඡාව ඒ නිමිත්තෙනි.**

**ඔබ මේ වන විට රුසියානු කෘති සියයකට අධික සංඛ්‍යාවක් පරිවර්තනය කොට පළකොට තිබෙනවා. බොහෝ දෙනා කියන්නේ මේ ඔබට ප්‍රමාද වී ලැබුණු සම්මානයක් කියා... ඒ ගැන ඔබේ අදහස?**

සම්මාන හෝ අගැයීම් බලාපොරොත්තුවෙන් සාහිත්‍යකරණයේ යෙදුනා නම් මටත් එහෙම හිතෙන්න තිබුණා. නමුත් මගේ කලා භාවිතාව තිබෙන්නේ 'මනුෂ්‍ය ජීවිතය වඩාත් උස් තලයකට ගෙන යාමේ' ඉලක්කය ඔස්සේ යි. එය ආත්මලාභයට එපිට ගිය කාරණයක්. සම්මාන හෝ අගැයීම් බලාපොරොත්තු වෙනවා නම් එතැන ම ඒ ඉලක්කය බිඳවැටෙනවා. 'දෙන් නදිය' පළමු පොත පිට වූ පසුව පමණක් මම 'යෞවන සම්මාන' උළෙලට එය ඉදිරිපත් කොට 'හොඳ ම ප්‍රකාශිත කෘතියට' හිමි සම්මානය ලැබුවා. එද එසේ ඉදිරිපත් කිරීමට හේතු වුණේ, මේ ක්ෂේත්‍රයට පය ගසා ගැනීමේ දී එය කිසියම් පහසුවක් සලසන නිසා පමණයි. එයින් පසු මා එවැනි දේට ඉල්ලුම් කර හෝ එවැනි දේ බලාපොරොත්තු වී හෝ නැහැ. සම්මානයක් කියන්නේ අගැයීම හා ආදරය පිරිනැමීමක් නම්, එසේ ම ඉහතින් ඔබ කී පරිදි බොහෝ දෙනා එවැනි සම්මානයක් මට ලැබීමට පමා වී ඇති බවක් කියනවා නම්, එහි අදහස ම ඔවුන් මා අතින් සිදු වී ඇති සොච්චම් මෙහෙය අගය කරමින් මට ආදරය කරනවා යන්න යැයි මා කල්පනා කරනවා. ඒ හොඳට ම ඇති.

**ඔබේ පරිවර්තන කාර්යය දේශපාලනික යැයි ඔබ කියනවා. මොකක්ද ඒ කතාව?**

ආදි කල්පික මානවකල්ප වානරයා අතට ගත් ගල උල් කොට තමන්ගේ පළවෙනි උපකරණය හදගත් ද ඉඳලා ඔහු පරිසරය හා තමන්ගේ ජීවිතය වෙනස් කරන්න ගත්තා. මගේ අවබෝධයේ තරම අනුව, ඒ උපකරණ නිර්මාණයේ හා භාවිතයේ උපරිම තැනක ඇති දේවල් අතර සාහිත්‍යයත් තිබෙනවා. සාහිත්‍යය මනුෂ්‍ය ජීවිතය සහ පරිසරය වෙනස් කිරීමට බලපානවා. වඩාත් යහපත් වෙනසක් උදෙසා සාහිත්‍යය යොදා ගැනීම ගැන ගෝර්කි, ෂෝලහොව් වැනි ලේඛකයෝ කතා කළා. මා සිටින්නේ ඔවුන්ගේ මාවතේ. මිනිසාගේ ජීවිතය සහ වටපිටාව වෙනස් කිරීම යනු ම දේශපාලනය යි. දරුවන් උදෙසා කරන පිටු අටක දහයක කුඩා කෘතියේ ඉඳලා, දෙන් නදිය වැනි කෘතියක් දක්වා මා විසින් සිදු කෙරී ඇති සෑම පරිවර්තනයක ම යට ඇත්තේ සාමූහිකත්වය කුළුගන්වන්නා වූ මේ දේශපාලනය යි. කෙනෙක් අනෙකාගේ ගරුත්වය පාගා නොදමන ඒ වෙනුවට කෙනෙක් අනෙකාගේ ජීවිතයට උදව්වක් වෙන සමාජයක් උදෙසා වන දේශපාලනය යි.

**'දොන් නදිය නිසලව ගලා බසී' ඔබේ දැවැන්ත පරිවර්තන කෘතියක්. පිටු දෙදහසකට අධික කෘති මාලාවක්. රුසියානු විප්ලවය පසුබිමේ මානව සබඳතා පිළිබඳ තියුණු බැල්මක් සහිත ඒ කෘතිය සිංහල පාඨකයාට ප්‍රදානය කරන්න තෝරා ගත්තේ ඇයි?**

මානව ශිෂ්ටාචාරයේ සිදු වූ, විශාල ම කලබැගෑනීන්ගෙන් සහ දැවැන්ත ම පරිවර්තනයන්ගෙන් යුතු කාල පරිච්ඡේදයක් 1912-1923 අතර කාලයේදී රුසියාවේ ගෙවී යනවා. පළමු ලෝක යුද්ධය, ඔක්තෝබර් විප්ලවය, සිවිල් යුද්ධය යන කලබැගෑනි සහිත මේ කාලය තුළ ඊට මුහුණ දුන් මිනිස් ජීවිත දස දහස් ගණනක කතාවයි 'දෙන් නදිය'. ඒ තුළ ප්‍රේමය, වෛරය, වේදනාව, ප්‍රීතිය, වීරත්වය, බියගුලුකම, බලාපොරොත්තුව, අපේක්ෂා භංගත්වය, ප්‍රඥුව, මෝඩකම, ආවේගය, සහනුවේදනය.... මේ ආදී මනුෂ්‍ය ජීවිතයට අදාළ සියල්ල චරිත හයසීයක් ඔස්සේ එක ගෙත්තමකට ගන්නට ෂෝලහොව් සමත් වෙනවා. විශේෂයෙන් නව සමාජ පරිවර්තනයක දී පොදු මිනිසාත්, එකී පරිවර්තනයට සක්‍රීයව නායකත්වය දෙන අයත් මුහුණ දෙන ගැටලු පිළිබඳව මැදහත් සිතින් කෙරුණු සාහිත්‍යයික විවරණයක් ලෙසත් එය සැලකිය හැකි යි. අනෙක් අතින්, මිනිසා සිය භූමියට ඇති බැඳීම පිළිබඳ ගැඹුරු සාකච්ඡාවක් මේ තුළ කෙරෙන බව මගේ කල්පනාවයි.

මා ඉහතින් කී ලෙස, වඩා ඉහළ මනුෂ්‍ය සමාජයක බලාපොරොත්තුව සහිත හැම කෙනෙකුට ම මේ අත්දැකීම් වැදගත් වෙනවා, තමන්ගේ ගමන වඩාත් සුමට කොට ගන්නට.

දිගු කාලීනව බරපතළ යුද අත්දැකීම් ලැබූ අපට, ලාංකේය පාඨකයාට මෙහි අන්තර්ගතය වඩාත් සමීපව දැනෙනවා. යුද්ධයකදී අහිමිවෙන ජීවිත හා මානව බැඳීම් පිළිබඳ හැඟීම් දැනීම් දුක වේදනාව දේශසීමාවන් කාලසීමාවන් නැතිව කොතැනටත් පොදුයි. ඒ වගේම යුද්ධයක වීරයෝ නැති බව මේ කෘතිය මනාව පැහැදිලි කරනවා. ඒ නිසා මෙය අපට අප ගැන සිතන්නට මගපෙන්වන කෘතියක් ලෙසත් මට හැඟී ගියා. ඒ වගේම ඉහළ පාඨක ප්‍රතිචාරත් ලැබුණා.

**ඔබේ රුසියානු පරිවර්තන පොත් ගොන්නේ වැඩි සංඛ්‍යාව ළමා පොත්. රුසියානු ළමා සාහිත්‍යය මෙරට පාඨකයන්ගේ කියවීමේ රුචියට විශාල බලපෑමක් කළ බව රහසක් නොවෙයි. රුසියානු ළමා කතා සාහිත්‍යයේ ඔබ හඳුනාගත් විශේෂතා මොනවාද?**

ම'විසින් මෑතක පරිවර්තනය කෙරුණු 'රන් රාජාලි ඉගිල්ලෙති' කෘතියේ කර්තෘ මුස්තායි කාරිම් නම් රුසියානු ලේඛකයා මෙහෙම කියනවා: "මගේ පොත් ඊයේ දරුවන් වූ වැඩිහිටියන්ටත්, හෙට වැඩිහිටියන් වන දරුවන්ටත් ය." මුහුණු පොතේ, මගේ එක් පාඨකයෙක් මෙවැනි සඳහනක් කළා: "ලොව හොඳ ම පොත් වන්නේ හැම කෙනෙකුට ම රසවිඳිය හැකි ඒවායි." මෙන්න මේ උපුටන දෙක එකට ගෙන මුළු මහත් රුසියානු ළමා සාහිත්‍යයට ම අදාළ කළ හැකි යැයි මට සිතෙනවා. එම කෘති වැඩිමනක් දරුවන්ට හා වැඩිහිටියන්ට එක සේ රසවිඳිය හැකි ඒවා යි.

රුසියානු ළමා සාහිත්‍ය වඩාත් විකසිත වූයේ සෝවියට් යුගයේ දී. ළමා මනෝවිද්‍යාව හා සමාජ විද්‍යාව පාදක කොට ගනිමින්, සාමූහික මනෝභාවය සහිත නිර්මාණශීලී දරුවකු බිහිකර ගැනීමේ අරමුණ ඇතිව, සැලසුම් සහගතව සහ රාජ්‍ය අනුග්‍රහය ඇතිව ළමා සාහිත්‍යයක් තිබුණේ එම සෝවියට් යුගයේ රුසියාවේ පමණක් ය යන්නයි මගේ අදහස. තෝල්ස්තෝයි, චෙකෝව් වැනි මහා ලේඛකයින්ගේ පූර්ව ආදර්ශයන් ඔස්සේ, ගෝර්කි නමැති මහා ලේඛකයා තමයි එහි ශක්තිමත් අඩිතාලම දැමූයේ.

සරලත්වයේ සිට සංකීර්ණත්වය දක්වා ළමයා රැගෙන යාමේත්, දරුවා තුළ සංකල්ප රූප වර්ධනය කිරීමේත් ගුණයන් විශේෂයෙන් මේ කෘතිවල දකින්නට පුළුවන්. එසේ ම දරුවන් සඳහා වූ කෘතිවලට එක්ව ඇති සිතුවම් සම්බන්ධව වෙනම ම කතා කළ යුතු තරම් සුවිශේෂ යි. ඔවුන් භාවිත කරන වර්ණ හා හැඩතල කොතරම් සිතට කාවදිනසුලු ද යත් දරුවන් වැඩිහිටියන් වූ පසු පවා මතකයෙන් ගිලිහී යන්නේ නැහැ.

වර්තමානයේ නැවත නැවත ප්‍රකාශයට පත්වෙන විට පවා රුසියානු ළමා පොත්වල ඒ සුවිශේෂත්වය ආරක්ෂා කර ගැනීමට අපි උනන්දු වෙනවා. වචන, රූප, වර්ණ, නිමාව ඒ හැම අංශය ගැනම අවධානයෙන් සිටිමින් ළමයා පියවරක් ඉදිරියට ගෙනයාමට හැකි අයුරින් ඒ කාර්යයේ නියුතු වෙනවා.

**අද ළමා පරපුර රුසියානු පොතපතට දක්වන ඇල්ම පිළිබඳ ඔබට ඇති අත්දැකීම කොහොමද?**

දැඩිගම වී. රුද්‍රිගු හා පද්ම හර්ෂ කුරණගේ සූරීන් දෙදෙනා කළ ළමා සාහිත්‍ය පරිවර්තන බොහෝ යි. ඒවා විවිධ ප්‍රකාශකයින් අතින් යළි යළිත් අදටත් මුද්‍රණය වෙනවා. මා අතින් මෙතෙක් පරිවර්තනය වූ පොත්වලින් වැඩිමනක් එක් මුද්‍රණ වාරය ඉක්මවා තිබෙනවා. ඒ අනුව තවමත් රුසියානු ළමා පොත් අලෙවියක් ඇති බව කිව හැකියි.

එසේ ම රුසියානු පොත්වලට ඇල්මක් දක්වන බොහෝ ළමුන් මට නිතර ම වාගේ මුණ ගැසෙනවා. විශේෂයෙන් හාස්‍ය රසය මුසුකොට ලියැවුණු, නිකොලායි නෝසව් වැනි ලේඛකයින්ගේ කෘතිවලට ළමුන්ගේ වැඩි කැමැත්තක් පෙනෙනවා.

කෙසේ වෙතත් දරුවන්ගේ රුචිය වැඩවීමේ දී මව්පියන් ඇතුළු වැඩිහිටි පරපුර ඒ කෙරෙහි දක්වන උනන්දුව වැදගත් වෙනවා. මගේ අත්දැකීම් සහ නිරීක්ෂණය අනුව නම්, රුසියානු පොතපතට වැඩි නැඹුරුවක් ඇති මව්පියන්ගේ දරුවන් එම පොත් කෙරේ වැඩි නැඹුරුවක් හා ඇල්මක් ඇති බව කිව හැකියි.

නමුත් මේ වෙනවිට සමස්තයක් වශයෙන් පොත් කර්මාන්තයේ අර්බුදය මේවාටත් බලපාන බව කිව යුතුයි. හොඳ පොත්වලට වඩා ලාබ පොත් වෙත දෙමව්පියන් නැඹුරුවීම සිදුවිය හැකියි. නමුත් අද සුලබ ඇතැම් ළමා කෘති ළමා පොතකින් අපේක්ෂිත අරමුණු ඉටුකිරීමට සමත් වන්නේ නෑ. ඒ ගැන පොදු කතිකාවක් සිදුවෙනවා නම් හොඳයි.

**රුසියානු නවකතා, ළමා කතා, යොවුන්, විද්‍යා, නාට්‍ය හා වෙනත් බොහෝ ග්‍රන්ථ පරිවර්තනය කළ ඔබ රුසියානු කවි පරිවර්තන කෘතියකට උනන්දු වූයේ නැත්තේ ඇයි?**

පරිවර්තනයේ අසීරු ම ඉසව්ව තමයි කවිය. කවියේ මූලික අදහස සහ රසය නොමරා වෙන බසකට ගැනීම සෙල්ලමක් නොවෙයි. කෙසේ වුවත්, වෙන ම පොතක් ලෙස ප්‍රකාශයට පත් වූයේ නැති නමුත් රුසියානු කවි බොහෝ ගණනක් මා අතින් පරිවර්තනය වී තිබෙනවා. මහා කවියෙකු ලෙස සැලකෙන රසූල් ගම්සොටොව්ගේ එක ම ගද්‍ය කෘතිය වන 'මගේ දගෙස්ථානය' කෘතිය පරිවර්තනය කරද්දී, එහි එන ඔහුගේ කවි පංති විස්සකට වැඩි ප්‍රමාණයක් මම සිංහලට නැඟුවා. විශේෂයෙන් ළමුන් වෙනුවෙන් ලියූ ආග්නියා බර්තෝගේ සහ කෝර්නෙයි චුකොව්ස්කිගේ කවි ඇතුළු ළමුන් සඳහා කෙරුණු නිර්මාණත්, හයිකු ආරේ කවි ගණනාවකුත්, වෙනත් කවීන් කීප දෙනෙකුගේ නිර්මාණත් ම'විසින් පරිවර්තනය කෙරී තිබෙනවා. ඉඩක් ලැබුණොත් ඉදිරියේදී ඒවා පොතක් ලෙස ප්‍රකාශයට පත් කරන්නට බලනවා.

සංවාදය
**පුෂ්පා ඉලංගන්තිලක**

**ඉතිහාසයේ සුවිශේෂී සිද්ධීන් රැසක් සිදුව ඇති හඳපාන්විල රාජමහා විහාරස්ථානය පිහිටා ඇත්තේ පොළොන්නරුව දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් හඳපාන්විල විල්ලු පද්ධතිය මැදිකර ගනිමිනි.**



ගල මත ඇති රුවල් නැව් සංකේත

# මහවැලි ගඟ දිගේ පොළොන්නරුවට නැව් ආ යුගයක්

ක්‍රිස්තු පූර්ව දෙවන සියවසේ ලජ්ජතිස්ස රජතුමා විසින් මහා සංඝයාට පූජා කරන ලදැයි කියන මේ පින්බිම එද හැඳින් වූයේ දූවේගල නමිනි.

ඈත අතීතයේ භික්ෂූන් වහන්සේලා වැඩ සිට ඇති මෙම ගල්ලෙන තුළ පිහිටි සෙල්ලිපියේ සංඝරක්ඛිතගේ ලෙන නමින් ද හඳුන්වා ඇති බවට පුරාවිද්‍යා සාක්ෂි සනාථ කරයි.

ලජ්ජතිස්ස දුටුගැමුණු රජතුමාගේ සොයුරු සද්ධාතිස්ස රජුගේ දෙටු පුතණුවන් වූ අතර, දිඹුලාගල දූවේගල හෙවත් හඳපාන්විල පැරණි විහාරය නිර්මාණය වන්නේ ඔහුගේ අතිනි.

දිඹුලාගල කඳුයාය පේන මානයේ පිහිටි 'දූවේගල' ස්වභාවික සෞන්දර්යයෙන් අනූන සෙනසුන් වෙහෙරකි.

මනරම් ගල් පව්වෙන් සුසැදි වෙහෙර අතීත ලක්රාජ කතාවේ නවාතැන්පොළ බවට පත්වන්නේ එහි සනිටුහන් ගිරිලිපිය නිසාය.

දිඹුලාගල මහියංගනය ප්‍රධාන මාර්ගයේ ගමන් කර මගුල්දමන ගම්මානයේ සිට දකුණු දෙසට කිලෝමීටර් තුනක් පමණ ගියපසු සුන්දර වනයක, තුරුලතාවලින් සපිරි, ගල් පර්වතයක් මත පිහිටා තිබෙන මෙම හඳපාන්විල රාජමහා විහාරස්ථානය ප්‍රෞඪ ඉතිහාසයක් මෙන්ම පුරාවිද්‍යාත්මක වටිනාකම් රැසක් තිබෙන පුණ්‍ය භූමියකි.

අලි ඇතුන්, වග වලසුන් මෙන්ම සතා සිව්පාවන්ගෙන් අඩුවක් නොමැති මෙම විල්ලු පද්ධතිය, ශ්‍රී ලංකාවේ විශාලතම විල්ලු පද්ධතිය ලෙස නම්දරා තිබීම ද තවත් විශේෂත්වයකි.


හඳපාන්විල රාජමහා විහාරස්ථානයේ ගල්ලෙනක් තුළ පිහිටා තිබෙන රුවල්නැවෙන් සහ ඒ අසල තිබෙන සෙල්ලිපියෙන් ඈත අතීතයේ අපේ මුතුන් මිත්තන් ප්‍රදේශයේ සිදුකළා වූ වාරි ශිෂ්ටාචාරය මෙන්ම වෙළෙඳ භාණ්ඩ හුවමාරුව හා ගනුදෙනු සම්බන්ධ සිද්ධීන් රැසක් සිදුව ඇති බවට පුරාවිද්‍යා සාක්ෂිවලින් සනාථ කරයි.

මේ දක්වාම යක්කුරේ දුමින්දලංකාර හිමියන් හඳපාන්විල රාජමහා විහාරස්ථානය තවදුරටත් සංවර්ධනය කරමින් පළාතේ බෞද්ධ ජනතාවගේ මුදුන් මල්කඩක් බවට පත්කිරීමට අතිවිශිෂ්ට මෙහෙවරක් ඉටුකරති.

අප මෙම කරුණු කතා කරන්නට මුලපුරන්නේ ඈත අතීතයේ විවිධ විදෙස් රටවල් අප රට හා බැඳුණු වෙළෙඳ ගනුදෙනු රැසක් සම්බන්ධයෙන් හඳපාන්විල රාජමහා විහාරස්ථානයේ ගල්ලෙනක මතු වී තිබෙන රුවල්නැවක සංකේතය හා ඒ අසල පිහිටි සෙල්ලිපියත් ආශ්‍රය කර ගනිමිනි.

එද අපේ මේ දිවයින ඉන්දියන් සාගරයේ මුතු ඇටය මෙන්ම පෙරදිග ධාන්‍යාගාරය ලෙස ද නම් කළහ. ඒ නිකම්ම නොවේ, ඈත අතීතයේ සිට අපේ රටේ නිෂ්පාදනය කරන ලද සහල්, කුළුබඩු ඇතුළු අනෙකුත් වෙළඳ භාණ්ඩ ලෝකයේ අනෙකුත් රටවල් සමඟ හුවමාරු කරගෙන ඇති බවට පුරාවිද්‍යාත්මක ගවේෂණ සහ සාක්ෂි අනාවරණය වීමත් සමගිනි.

ඊට හොඳම සහතිකය වන්නේ ඓතිහාසික පොළොන්නරුව පුරවරයේ දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් හඳපාන්විල රාජමහා විහාරස්ථානයේ ගල්ලෙනක පිහිටා ඇති රුවල්නැවේ සංකේතය හා පුරාවස්තු නටබුන් සහ සෙල්ලිපිය.


යක්කුරේ දුමින්දලංකාර හිමියෝ

මෙලෙස ලොව විවිධ යුගවල, විවිධ රටවල්වල ජනයා, විවිධ අරමුණු පෙරදැරි කරගෙන තම වාසස්ථානයෙන් බැහැරව සංචාරයේ යෙදුණු අතර එය බොහෝ රටවල විදේශ විනිමය විශාල වශයෙන් ගෙනදෙන සමාජීය හා සංස්කෘතික සම්බන්ධතා වර්ධනය කරන අතිශයින් ජනප්‍රිය විෂයයක් බවට අතීතයේ පත්ව තිබිණි.

පොළොන්නරුව දිඹුලාගල හඳපාන්විල රාජමහා විහාරස්ථානයේ ගල්ලෙනෙ සටහන්ව ඇති රුවල් නැව්වල සංකේතයෙන් අතීතයේ වෙළෙඳ භාණ්ඩ හුවමාරු ප්‍රධාන කේන්ද්‍රස්ථානයක් බවට පත්ව ඇති බව පුරාවිද්‍යා නිලධාරීහු අනුමාන කරති.

ශ්‍රී ලංකාවේ දිගම ගංගාව වන මහවැලි ගඟ භාවිතා කරමින් ඈත අතීතයේ ඓතිහාසික පොළොන්නරුව, හඳපාන්විල, මනම්පිටිය, කොටලීය, මුතුගල හා ත්‍රිකුණාමලය දක්වා දිවෙන විල්ලු පද්ධතිය භාවිතා කරගෙන එහි වෙළෙඳ භාණ්ඩ රැස්කර ගනිමින් ගංගාව ඔස්සේ පැමිණි රුවල්නැව් සඳහා වෙළෙඳ භාණ්ඩ පටවා, එකල වෙනත් ප්‍රවාහන මාධ්‍ය මගින් ලෝකය පුරා රටවල් වෙත රැගෙන ගොස් ඇති බවට ජනප්‍රවාද තොරතුරු මෙන්ම ගවේෂණ තොරතුරු අනුව පැහැදිලි වන බව පුරාවිද්‍යා ගවේෂණවල නිරතවන විද්වත්හු අනුමාන කරති.

ඈත අතීතයේ එතරම් තාක්ෂණික පහසුකම් නොතිබුණ ද තිබූ පහසුකම් උපරිම ලෙස භාවිතා කරමින්, ගංගා විල්ලු පද්ධති හරහා වෙළෙඳ භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා ආදි මුතුන් මිත්තන් කටයුතු කළ ද වර්තමානයේ බොහෝ දෙනා එකල මුතුන් මිත්තන් භාවිත කළ ගංගා වනසමින් අපූරුවට වැලි ජාවාරම්වල නිරත වන බව නම් පැහැදිලිව දැකිය හැකිය.


වර්තමාන හඳපාන්විල රජමහා විහාරය


විහාරය අසල ඇති සෙල්ලිපි

කෙසේ වෙතත් මීට දින කිහිපයකට ඉහත දී ත්‍රිකුණාමලේ සිට ධීවරයින් පිරිසක්, පාරු කිහිපයක් උපයෝගී කරගනිමින් දින හතරක කාලයක් තුළ වැලිකන්ද මුතුගල විල්ලුවට ධීවර කටයුතු සඳහා පැමිණ ඇති බව වැලිකන්ද ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ලේඛකාධිකාරී සුසිරිගම සංඝරක්ඛිතාලංකාර හිමියන් අප සමග සිහිපත් කළේ ඈත අතීතයේ මහවැලි ගංගාව ඔස්සේ පැමිණි බව කියන රුවල්නැව් කතාව ද සිහිපත් කරමිනි.

හඳපාන්විල රජමහා විහාරස්ථානයේ පවතින සෙල්ලිපිවලින් සහ අනෙකුත් සාක්ෂි පදනම් කරගනිමින් අප සමග කතා කළ හඳපාන්විල රජමහ විහාරාධිපති යක්කුරේ දුමින්දලංකාර හිමියන් සඳහන් කළේ ඈත අතීතයේ දෙස්, විදෙස්, සංචාරකයන්ගේ මහත් ගෞරවාදරයට පාත්‍ර වූ හඳපාන්විල රාජමහා විහාරස්ථානය හරහා ප්‍රදේශයේ එද සිටි ජනතාව සේද මාවත ඔස්සේ ගෝමතී ඇළ දක්වා ගොස් එම වෙළෙඳ භාණ්ඩ, කුළුබඩු, සහල්, ධාන්‍ය වර්ග, පලතුරු වර්ග ලෝකය පුරා බෙදහැර ඇති බවට අනුමාන කරන බවයි.

## පොළොන්නරුවෙන් මුහුදු ගිය ගටගියාවක තොරතුරු හෙළිවන ගල්පව්වේ රුවල් නැවේ සිතුවම

මහවැලි ගංගාව ඔස්සේ පැමිණි රුවල්නැව් හඳපාන්විල විල්ලුව ආසන්නයේ තිබූ වරාය හෙවත් ජැටිය ආසන්නයේ නවතා ඇති බවට ඒ ආසන්නයේ ඇති පුරාවිද්‍යා සාක්ෂිවලින් අනුමාන කරයි.

දිඹුලාගල හඳපාන්විල දූවේගල පිහිටි මෙම ස්ථානය ශ්‍රී ලංකාවට විශාල ආදයම් ඉපැයූ මධ්‍යස්ථානයක් බවට එම රුවල්නැව් හා සෙල්ලිපි ආශ්‍රයෙන් සංකේතවත් වන බවත්, පුරාවිද්‍යා ගවේෂණ ඒ සඳහා සාක්ෂි සපයන බවත් දුමින්දලංකාර හිමියෝ සඳහන් කළහ.

ලොව බෞද්ධ රටවල්වල භික්ෂූන් වහන්සේලා මෙම ස්ථානය කේන්ද්‍ර කරගනිමින් අතීතයේ වැඩමවා රට පුරා ධර්ම ප්‍රචාරය කර ඇති බවට සාක්ෂි ඇති බවත්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පොළොන්නරුව පුරාවිද්‍යා සහකාර අධ්‍යක්ෂ නලින් වීරරත්න මහතා මේ පිළිබඳව අදහස් දක්වමින් සඳහන් කරන්නේ හඳපාන්විල රජමහා විහාරස්ථානයේ ගල්ලෙනක සංකේතවත් වන රුවල්නැව මගින් ප්‍රදේශයේ වෙළෙඳ භාණ්ඩ ගනුදෙනුවක් සිදුව ඇති බවට අනුමාන කරන බවයි.

ඒ බව අනුරාධපුර යුගයට අයත් හඳපාන්විල ගල්තලාවක තිබෙන ශිලා ලේඛනයෙන් සහ රුවල්නැවකින් සංකේතවත් වන බවත් රුවල්නැව අසල සිට හඳපාන්විල විල්ලුව දෙසට ජැටියක් (ගල් පාලමක්) තිබී ඇති බවට සාධක පවතින බවත්, එම ගල්පාලම ගැන අද හෙටම ගවේෂණ කටයුතු සිදුකරන බවත් නලින් වීරරත්න මහතා වැඩිදුරටත් අප කළ විමසීමක දී සඳහන් කළේය.

පොළොන්නරුව යුගයේ දී කාලිංග දූපතට ඉහළින් මහවැලි ගඟ හරහා වේල්ලක් ඉදිකර ගෝමතී ඇළට සහ කාලිංග ඇළට ජලය ගෙන ඇති බවත් ප්‍රදේශයෙන් රුවල්නැව් මගින් වෙළෙඳ භාණ්ඩ රැගෙන ගොස් ඇති බවටත් පවතින සාක්ෂි අනුව අනුමාන කරන බව ද නලින් වීරරත්න මහතා කීවේය.

**සටහන හා ඡායාරූප**
**මනම්පිටිය නිමල් ජයරත්න**

---

# නොනවතින ධීවර අරගලය



**ඉල්ලීම් කිහිපයක් මුල් කරගනිමින්, මීගමුවේ ධීවර ජනතාව මේ මොහොතේ අරගලයකට අවතීර්ණ වී සිටිති. ධීවර කර්මාන්තයට සෘජුව සම්බන්ධ වී සිටින ධීවර පවුල් ලක්ෂ තුනක් පමණ මීගමුව ප්‍රදේශයේ සිටින බවත්, ඉන් වක්‍රව යැපෙන ලක්ෂ පහකට ආසන්න පිරිසක් ගම්පහ දිස්ත්‍රික්කය තුළ සිටින බවත් පවසන්නේ සමස්ත ලංකා ධීවර ජනතා වෘත්තිය සංගමයේ ජාතික සංවිධායක ප්‍රසංග ප්‍රනාන්දු මහතාය.**

සිය සංගමය ඇතුළු ධීවර සංගම් එක්ව මෙම අරගලය පවත්වන බවත්, ඉදිරි දින කිහිපය තුළ අතිශය තීරණාත්මක තීන්දු තීරණ රැසක් ගැනීමට සමස්ත ධීවර ප්‍රජාව වෙනුවෙන් සූදානම්ව සිටින බවත් ඔහු ආණ්ඩුවට රතු එළි නිකුත් කරමින් පවසයි.

කළපු ධීවරයන්, මුහුදු ධීවරයින්, සුළු පන්න සහ ගැඹුරු මුහුදේ මාළු අල්ලන ධීවරයන් මෙන්ම මාළු සිල්ලරට විකුණන, ලුණු විකුණන, ධීවර ආම්පන්න සහ මාළු ප්‍රවාහන කටයුතු කරන, කෑම විකුණන පිරිස් ද ඇතුළුව ලක්ෂ අටකට ආසන්න ඍජු හා වක්‍රව ඉන් යැපෙන පිරිසක් ධීවර කර්මාන්තයේ පවතින ගැටලු නිසා බරපතළ පීඩාවකට පත්ව සිටින බව ද ඔහු පවසන්නේ එම ගැටලු එකින් එක ඉදිරිපත් කරමිනි.

භූමිතෙල් මිල අධික ලෙස ඉහළ යාම, වැලි ගොඩ දැමීම නිසා පාරිසරික ගැටලු ගණනාවක් මතුවීම, ධීවර ආම්පන්න මිල ඉහළ යාම, මුහුදු ඛාදනය වැනි ගැටලු හේතුවෙන් ධීවර ප්‍රජාව මෙම කර්මාන්තයෙන් මේ වන විට ඈත්ව යන තත්ත්වයකට පත්ව සිටින බව ද ඔහු පෙන්වා දෙන කරුණු අතර වෙයි.

අදාළ ගැටලුවලට විසඳුම් ඉල්ලා පාරට බහින්නටත් සමස්ත ධීවර ප්‍රජාව වෙනුවෙන් අතිශය තීරණාත්මක තීන්දු තීරණ රැසක් ගැනීමටත් මේ අනුව එම ධීවර සංගම් තීරණය කර තිබේ. මේ මොහොතේ ගම්පහ, පුත්තලම, කල්පිටිය දක්වා වූ සියලුම ධීවර සමිති සංවිධානය කරන අතර , කඩින් කඩ කරමින් පවතින ධීවර උද්ඝෝෂණ වෙනුවට දැඩි තීන්දුවක් ගැනීමටත් කටයුතු කරන අතර දැවන්ත පරිසර හානියක් කරමින් වැලි ගොඩදැමීමට යොදු ගන්නා නැවට එරෙහිව තහනම් නියෝගයක් ගැනීමට ද සූදානම්ව සිටින බව ද ඔහු මෙහිදී පෙන්වා දෙයි.

මේ මොහොතේ මීගමුවේ ධීවර ජනතාව මුහුණ දී සිටින ඒ සා විශාල ප්‍රශ්නය කුමක් දැයි අපි ඔහු විමසුවෙමු.

"පළමුවෙනි ප්‍රශ්නය තමයි භූමි තෙල් මිල අධික ලෙස ඉහළ යාම. රුපියල් 87 ට තිබුණු භූමි තෙල් ලීටරයක් දැන් වන විට රුපියල් 340 - 350 වගේ මිලකට ඉහළ ගිහින් තියෙනවා. භූමි තෙල් විතරක් නෙමෙයි එන්ජින් එකට දමන භූමිතෙල්වලට ඔයිල් ලීටරයක් දමන්න ඕනෑ. ඉස්සර රුපියල් 700 කට පමණ තිබූ ඔයිල් ලීටරයක් රුපියල් 2500-2800 විතර යනවා. සාමාන්‍යයෙන් අපේ පොඩි බෝට්ටුවක ධීවරයෙක් දවසකට තෙල් ලීටර් 50 -60 ක ප්‍රමාණයක් පාවිච්චි කරනවා. ටිකක් ගැඹුරු මුහුදේ මාළු අල්ලන්න ගියාම. ඒ කාලයේ භූමිතෙල් මිල වැඩි වෙන්න කලින් තිබුණේ ලීටර් 50 යි ඔයිලුයි ගැහුවහම අපිට වෙන්නේ රුපියල් 4800 - 5000 ත් අතර මිලක් තමයි අපිට වියදම ලෙස වෙන්නේ. හැබැයි දැන් ඒ ලිටර් 50 යි ඔයිලුයි ගැහුවහම රුපියල් 20,000 කට ආසන්න ප්‍රමාණයකට වැඩි වෙලා තියෙනවා.

මාළුවලට මිලක් නොමැති වීමත් ධීවර ජනතාව මුහුණ දෙන ලොකු ප්‍රශ්නයක්. පහුගිය කාලයේ මිනිස්සු මුහුදු යන්නේ නැති නිසා, මාළු මිල ඉහළ ගිහින් තිබුණා. ඒ දිනවල රුපියල් 3000-4000 ට තිබුණු තෝර කිලෝව අද යන්නේ රුපියල් 1800 -1500 - 900 වගේ මිලකටයි. ඉඳහිටලා 2000 ට 2500 යන අවස්ථාත් තිබුණා. නමුත් රුපියල් 900 ටත් යන අවස්ථා තියෙනවා.


සමස්ත ලංකා ධීවර ජනතා වෘත්තිය සංගමයේ ජාතික සංවිධායක ප්‍රසංග ප්‍රනාන්දු

ඊළඟ කාරණය තමයි මුහුදේ වැලි ගන්න එක. මීගමුව ආශ්‍රිතව තුන්ගල්පිටිය, සෙත්තපපාඩුව, කැපුම්ගොඩ අවට මුහුදෙන් තමයි නැවකින් වැලි ගන්නේ. ඉස්සෙල්ලාම ඔය නැවෙන් වැලි ගත්තා, හැදල පැත්තේ වැලි විකුණන්න ගත්තා. ඊට පස්සේ පෝර්ට් සිටිය ගොඩ කරන්න කියලා වැලි ගත්තා. ඊළඟට අධිවේගී මාර්ගය ගොඩ කරන්න වැලි ගත්තා. දැන් එල්එන්ජී ප්ලාන්ට් එකක් මුතුරාජවෙල හයිකරන්න යනවා. ඒකට කියලා දැන් වැලි ගන්නවා. එකම තැනින් ඒ කියන්නේ මීගමුව අවට ජනතාවගේ සුළුපන්න ධීවරයින්ගේ හදවත කියලා කියන තැනින් තමයි ඔය විදියට වැලි ගන්නේ. ඔය හරියට කියන්නේ තඹගල කියලා කියන හරියේ තමයි බොහෝම විශේෂයි. ඔය පැත්තෙන් තමයි කැලණි ගඟ බහින තැන. ඔය හරියේ නැව් එහෙම ගිලුණු තැන් තියෙනවා. බත්තල් ලොකු බෝට්ටු වැනි දේවල්.

ඔතැන තව තියෙනවා විශාල ගල්. එකක් තඹගල, අනික දරත්ත කියලා විශාල ගලක්. ඔය ගල්වල තුන්සිය හැටපස් දවසෙම මාළු අල්ලන්න පුළුවන්. පොඩි මාළු ඉන්න වෙලාවට පොඩි මාළු අල්ලනවා. ලොකු මාළු ඉන්න වෙලාවට ලොකු මාළු අල්ලනවා. මේ විදියට මුහුද යට තමයි මේ විශාල ගල් තියෙන්නේ. ගම්පහ දිස්ත්‍රික්කයේ අපට තියෙන සශ්‍රීකම පැත්තෙන් තමයි මේ නැව් වැලි ගන්නේ. මේ නැව වැලි ගනිද්දී ගොඩාක් වෙලාවට පොළවේ තියෙන ගල් ඒ වගේ සියල්ල කැඩෙනවා. සම්පූර්ණයෙන්ම වැලි ගත්තහම ලොකු දූවිලි ප්‍රමාණයක් මුහුදේ විහිදෙනවා. දියකඩට එහෙටත් යනවා මෙහෙටත් යනවා. සෑහෙන කාලයක් යනවා ඒ වැලි පොළව යටට බහින්න. ඒ දූවිල්ල ආවම මිනිස්සුන්ට මාළු අල්ලන්න බැරිව යනවා. මේ වෙලාවේ මිනිස්සු රුපියල් 25,000 ක් විතර වියදම් කරගෙන ගියාම මාළු නැහැ. ඒ වතුර බොරයි. මඩ වෙලා. දූවිල්ල නිසා මාළු නැහැ. විවිධ පාරිසරික හේතූන් මේ වැඩේට බලපානවා. ඔය සංවර්ධන ව්‍යාපෘති නිසා ඍජුවම අගතියට ලක් වෙන්නේ සුලුපන්න ධීවරයෝයි. සුලු පන්න ධීවරයෝ තමයි ලංකාවේ මත්ස්‍ය ප්‍රෝටීන්වලින් සියයට 60 ක් ප්‍රෝටීන් සපයන්නේ. ලොකු බෝට්ටුවලින් කරන්නේ අල්ලන මාළු අස්වනු ඔක්කොම එක්ස්පෝර්ට් කරන එකනේ. අඩි 18 පොඩි බෝට්ටුවකට එන්ජින් එකක් එළියෙන් දාගෙන ගිහිල්ල ඒ කරන රැකියාවෙන් තමයි සුළුපන්න ධීවර කර්මාන්තය කරන්නේ" ඔහු දීර්ඝ විස්තරයක් කරමින් කියා සිටියේ එසේ ය.

ආණ්ඩුව සහනාධාර ඇතුළු විවිධ දේ ගැන බොහෝ තැන්වල කතා කරන බවත්, එහෙත් ධීවරයින් ගැන සාධාරණ සොයා බැලීමක් නොකරන බවත් ඔහුගේ චෝදනාවකි. දින හතරක් මුහුදු ගොස්, මාළු අස්වනු නෙළා ගත නොහැකි වී නම්, එම ධීවර ජනතාව විශාල පාඩුවකට මුහුණ දීමට සිදුවන බව ද ඔහු පෙන්වා දෙයි.

"ඇත්තටම තෙල්වලට විතරක් රුපියල් ලක්ෂ එකහමාරකට වඩා ණය වෙනවා. මේ වන විට මිනිස්සු ධීවර කර්මාන්තය අත්හරිමින් තියෙනවා. ඕනෑ තරම් බෝට්ටු කළපුවේ නතර කරලා තියෙනවා. ෆේස් බුක් එකට ගියොත් ඕනෑ තරම් පොඩි බෝට්ටු, මහ බෝට්ටු විකුණන්න දාලා තියෙනවා. දැන් මේ වන විට ලංකාවේ ප්‍රෝටීන්, කැලරි අඩු වෙලා තියෙනවා. මන්දපෝෂණ තත්ත්වයන් ඇති වෙලා තියෙනවා. ඊළඟට රට බාර ගන්න ඉන්න තරුණ පරම්පරාව ප්‍රෝටීන් ඌණතාවයෙන් පෙළන එකක්. රජය හැම තිස්සෙම අපිට තියෙන අදහස තමයි මේ මුහුද බදු දෙන්න යන්නේ. එක්කෝ නැව්වලට හෝ වෙන කාට හෝ බදු දීලා මේ සුළුපන්න ධීවර කර්මාන්තය විනාශ කරන්න හදන්නේ. උදහරණක් විදියට කිව්වොත් මීගමුවේ ඉඳලා ගල්කිස්ස පැත්තට යනකම්ම සම්පූර්ණ සංචාරක කලාපයක් කරන්න යන්නේ. එසේ සංචාරක කලාපයක් කරන එකේ ගැටලුවක් නැහැ. නමුත් මේ පාරම්පරික ධීවරයින්ගේ නිජබිම් තමයි මේ ගොල්ලන් මේ සඳහා භාවිතා කරන්නේ.

අපේ ඒරියා එක මේ පාරම්පරික ධීවර කර්මාන්තයේ යෙදෙන ධිවරයෝ ඉන්න ඉඩම් ටික සම්පූර්ණයෙන්ම නාගරික සංවර්ධන අධිකාරියට පවර ගෙන තියෙන්නේ. එසේ නාගරික සංවර්ධන අධිකාරියට පවර ගත්තහම ඕනෑ වෙලාවක අධිකරණයට යන්නේ නැතුව අපිව එළියට දන්න පුළුවන්. ඒ ඇක්ට් එක තියෙන්නේ ඒ තරම්ම ප්‍රබල එකක්. උසාවි යන්නත් බෑ. දීර්ඝකාලීන ප්ලෑන් එකක් ඇතුළේ තමයි මේගොල්ලෝ මේ සියල්ල කරගෙන යන්නේ. පැහැදිලිවම මේ ආණ්ඩුව කරන සංවර්ධන ව්‍යාපෘතීන්වලින් සුළුපන්න ධීවර කර්මාන්තය විනාශ කරන එකත්, මේ මුහුද කාට හෝ බදු දෙන්න ප්ලෑන් එකක් තියෙනවා කියන එක තමයි අපිට දැනගන්න තියෙන්නේ. මේක මේ අද ඊයේ ආපු එකක් නෙමෙයි. මේක මේ රනිල් වික්‍රමසිංහ, මහින්ද රාජපක්ෂගේ නෙමෙයි. මේක මේ සෑහෙන කල් ඉඳලා තිබ්බ විශාල ප්ලෑන් එකක්." ඔහු පවසයි.

භූමිතෙල් මිල ඉහළ යාම, මුහුදේ වැලි ගොඩ දැමීම, ඉවක් බවක් නොමැතිව කරන සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් සුලු පන්න ධීවර කර්මාන්තය හිතාමතා නැති කිරීම, පාරිසරික ගැටලු, මෙන්ම මෙම සංවර්ධන ව්‍යාපෘතීන් නිසා වෙන්නප්පුව, මීගමුව, වැල්ලවීදිය, කුඩාපාඩුව දැඩි ලෙස මුහුදු ඛාදනයට ලක්ව තිබෙන බවත්, මුහුදු ඛාදනය වීම වැළැක්වීමට විටින්විට ගල් ගෙනැවිත් ගොඩ කරනු ලැබුවද එය කිසිසේත් සාර්ථක විසඳුමක් නොවන බවද ඔහු කියා සිටියි.

පවතින මෙම තත්ත්වය පිළිබඳව අප ධීවර අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකුගෙන් විමසූ විට ඔහු පවසා සිටියේ මෙය රජයේ ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතියක් බවත්, මෙම ව්‍යාපෘතිය තුළ ධීවර ප්‍රජාවට ඔය කියන හානි සිදුවෙනවා නම්, ඒ පිළිබඳව අප දැඩි ලෙස සොයා බලා අදළ පියවර ගන්නා බවය. පරිසර වාර්තා ගන්නවා. අදාළ ආයතන දෙපාර්තමේන්තු අමාත්‍යාංශ මේ සියල්ල එකතු වෙලා තමයි අප කටයුතු කරන්නේ. මෙයින් ඔය කියන ආකාරයට ධීවර ප්‍රජාවට හානියක් සිදුවෙනවා නම්, ඒ පිළිබඳව සලකා බලා ඔවුන්ට අසාධාරණයක් නොවන ආකාරයෙන් කටයුතු කරනවා. ඒ පිළිබඳව සලකා බැලීම් දැනටමත් කෙරීගෙන යනවා. යම්කිසි පරිසර හානියක් නොවන ආකාරයට පරිසර අමාත්‍යාංශය පැත්තෙන් තමයි බැලිය යුත්තේ. ඔවුන් ඒ පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරියෙන් වාර්තා සියල්ල අරගෙන තමයි මේවා කරන්නේ." එම නිලධාරියා කීවේය.

ඔවුන්ට එම වාර්තා පිළිබඳව විශ්වසනීයත්වයක් නොමැති වීම යන කාරණය ගැනද අප විමසුවෙමු.

රටේ සංවර්ධන ව්‍යාපෘතියක් කරන විට ඒකට අවශ්‍ය කරන නීතිරීති රෙගුලාසි තියෙනවා. ඒවට අනුකූලව තමයි සියල්ල කරන්නේ. එහෙම නම් රටේ කිසිම සංවර්ධන ව්‍යාපෘතියක් නොකර ඉන්නයි වෙන්නේ. පරිසර වාර්තා විශ්වාස නැහැයි කියන එක සාධාරණ නැහැ. මධ්‍යම පරිසර අධිකාරියේ විද්‍යාඥයෝ තමයි මේ වාර්තා සකසන්නේ. නිලධාරීන් කියලා කියන්නේත් ඒ පිළිබඳ විශේෂඥ දැනුමක් තියෙන අයනේ. සාමාන්‍ය ජනතාව නෙමෙයින.

ධීවර ආම්පන්න, භූමිතෙල් මිල වැඩිවීම පිළිබඳව රජය ගන්නා වූ පියවර පිළිබඳව ද අප විමසා සිටියදී ඔහු ප්‍රකාශ කර සිටියේ, රටේ පවතින ආර්ථික තත්ත්වයත් සමග අවශ්‍ය පියවර දැනටමත් ගෙන තිබෙන බව ය.

ඉස්සර කිව්වේ භූමිතෙල් නෑ. කීයට හෝ දෙන්න කියලයි. දැන් භූමිතෙල්, ඉන්ධන හිඟයක් නැහැ. ඉන්ධන ඇතුළු පිටරටින් ගෙන්වන ඒවා තීරණය වෙන්නේ ලෝක වෙළෙඳපොළත් සමගයි. පුළුවන් තරම් සහනාධාර දීල තමයි රට මේ තත්ත්වයට පත් වුණේ.

**සටහන**
**පද්මිණී මාතරගේ**

